කටුනායක සීදූව නගර සභාව - 2024

-----------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කටුනායක සීදූව නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,  නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ)  (iv) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන  ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද  මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීදුව අමුණ පාර බහුකාර්ය ගොඩනැගිල්ල ඉඩමට ගෙවිය යුතු වන්දි මුදල හා ප්‍රමාද පොළී මුදල වූ රු.11,877,580 ක මුදල ප්‍රමිතියේ 2.2 (ආ) සහ 2.4 ඡේද අනුව ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් එසේ නොකර අසම්භාව්‍ය වගකීමක් ලෙස දක්වා තිබුණි. | සභා තීන්දුවක් මගින් තහවුරු කරගත් පසු ජංගම වගකීමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරන බව. | ප්‍රමිතියට අනුකූලව ගිණුම් ගත කිරීම කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ 3.28 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය ගණනයේදී තොග වෙනස්වීම් වටිනාකම රු. 3,086,111 ක් කාරක ප්‍රාග්ධන වෙනස්වීම ලෙස ගලපනු වෙනුවට අතිරික්තය ලෙසද ගෙවියයුතු දෑ වටිනාකම වැඩිවීම රු.19,731,036 ක් රු.84,563,534 ක් අඩුවීම් ලෙස ද ලැබිය යුතු දෑ වටිනාකම වැඩි වීම රු.21,118,029 ක් රු.235,582,728 කින් අඩු වීම් ලෙස ද දක්වා තිබුණි. | 2025 ගිණුම් සකස්කිරීමේදී නිවැරදි කරන බව. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. අගයන් නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | ප්‍රමිතියේ 3.29 ඡේදය අනුව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත උපකරණ මිලදීගැනීම් වටිනාකම රු.48,983,230 ක් වුවද, එය රු.48,396,232 ක් ලෙස රු.586,998 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකතු කිරීම්වල අගය දක්වා ඇති බව. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. අගයන් නිවැරදිව දැක්විය යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන්ගෙන් අඩුකර දැක්විය යුතු වුවද එකතු කර දක්වා තිබුණි. | 2025 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය වටිනාකම රු.64,139,382 ක් විය යුතු වුවද රු.67,944,777 ක් ලෙස රු.3,805,395 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2025 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 395 | දේපලක් සම්බන්ධයෙන් එහි ලංසු වටිනාකම් තීරණය කිරීමේදී සෑම විටම වරලත් තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් පදනම් කරගත යුතු වුවද සීදූව බ්‍රහස්පතින්දා සතිපොළ සහ ඇවරිවත්ත දිනපතා පොළ සඳහා තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන බව. | රීතිය අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය | වාහන 15 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදුකරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 නොවැම්බර් 04 දිනැති ගැසට්පත්‍රය අනුව වැළඳගෙන තිබූ 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/7 දරන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 19 හා 20 ව්‍යවස්ථා | ගාස්තු නොගෙවන ලද දැන්වීම් පුවරු ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අවධානය යොමුකරන ලෙස නිළධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 7.4.1 මාර්ගෝපදේශය | විධිමත් අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම් හැකිතාක් ඉක්මනින් සිදුකළ යුතු වුවත්, ලංසු විවෘත කිරීම 2022 අප්‍රේල් 26 දින සිදුකර, ලංසු ඇගයීම ඉන් මාස 01 කුත් දින 12 කට පසුව එනම් 2022 ජූනි 08 දින සිදුකර තිබුණි. | විගණන විමසුම පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් කොමසාරිස්ගේ 2021 අප්‍රේල් 09 දිනැති අංක GIR/2021/02-02 2021 දරන ලිපිය හා 2019 ජූලි 09 දිනැති අංක GIR/2019/03-1(Ins.& cirl) දරන චක්‍රලේඛය අනුව සැපයුම්කරුවන් වෙත වැට් බදු | 2025 වර්ෂයේ සිට වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යොමුකරන බව. | චක්‍රලේඛය අනුව වාර්තා යැවීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් පිළිබඳ විස්තර බදු කළමනාකරණය සඳහා දේශීය ආදායම් කොමසාරිස් වෙත යොමු කර නොතිබුණි. | | |
| (ආ) | 2024 අංක 16 දරණ එකතුකළ අගය මත බදු (සංශෝධන) පනතේ 3 (2) C ප්‍රකාරව බදු ගෙවිය යුතු කාලපරිච්ඡේදයකට (කාර්තුවකට) බදුවන සැපයුම රු.මිලියන 15 හෝ මාස 12 කට බදුවන සැපයුම රු.මිලියන 60 ඉක්මවිය හැකි බවට සාධාරණ හේතු පවතින විට එකතුකළ අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතුව පැවතියද, විගණිත දින වූ 2025 මාර්තු 04 දින වනවිටද ලියාපදිංචිය ලබාගෙන නොතිබුණි. ඒ අනුව ආදායම් එකතු වටිනාකම රු.125,545,846 ක් සඳහා සියයට 18 ක අනුපාතය මත රු.22,598,252 ක බද්දක්ද, නියදි පරීක්ෂාවට අනුව අවස්ථා 07 කදී සිදුකළ මිලදීගැනීම් සඳහා රු.1,004,603 ක එකතුකළ අගය මත බද්දක් ද සභාවට අහිමි වී තිබුණි. | 2025 වර්ෂයේ සිට වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යොමුකරන බව. | පරීක්ෂණයක් සිදුකර සභා අරමුදලට හා රාජ්‍ය ආදායමට සිදුවී ඇති පාඩුව හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.69,230,588 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.147,401,208 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට පැවති රු.61,870 ක අගරු චෙක්පතක් නිරවුල් නොවී පැවතුණු අතර මෙම වටිනාකම අගරු චෙක්පත් ලේඛනයේද සටහන් වී නොතිබුණි. මේ පිළිබඳව කලමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | අගරු චෙක්පත් ඉදිරියේදී නිරවුල් කරන බව. | අගරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2024 ඇස්තමේන්තු ගත ආදායම | 2024 බිල් කළ ආදායම | 2024 රැස්කළ ආදායම | 2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. `000 | රු. `000 | රු. `000 | රු. `000 | රු. `000 | රු. `000 | රු. `000 | රු. `000 |
| (i) | වරිපනම් හා බදු | 152,063 | 151,875 | 145,281 | 62,504 | 152,900 | 151,740 | 150,753 | 55,909 |
| (ii) | කුලී | 12,890 | 15,811 | 16,013 | 730 | 16,538 | 11,587 | 14,008 | 931 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,608 | 2,891 | 2,891 | - | 6,151 | 4,899 | 4,899 | - |
| (iv) | වෙනත් ආදායම් | 195,900 | 198,137 | 190,882 | 32,690 | 146,901 | 205,849 | 196,041 | 32,460 |
| | | 365,461 | 368,714 | 355,067 | 95,924 | 322,490 | 374,075 | 365,701 | 89,300 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ** කාර්යසාධනය **සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2024 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා බදු වටිනාකම රු. මිලියන 62.50 ක් වූ අතර එය බිල්කළ ආදායම වූ රු. මිලියන 151.87 ක වටිනාකමෙන් සියයට 41 ක් විය. හිඟ ශේෂයන් අයකර ගැනීමට සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ආදායම් පරීක්ෂකවරු හා දේපළ තහනම් කිරීමේ නිළධාරීන් කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රැස්කළ බලපත්‍ර ගාස්තු ආදායම සියයට 41 කින් එනම් රු.2,008,000 කින් ද ඇස්තමේන්තුගත ආදායම සියයට 25 කින් එනම් රු.1,543,000 කින් ද අඩුවී තිබුණි. | 2023 දෙසැම්බර් 31 දින දක්වා සභා තීරණ මත බලපත්‍ර ගාස්තු අයකළද 2024 ජනවාරි 1 දින සිට නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව ගාස්තු අයකර ඇති බැවින් ආදායම අඩුවී ඇති බව. | ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | දිගුකාලීනව ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සභාව විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර ගාස්තු නිසි කාලයේදී අයකර නොගැනීමෙන් දින 03ත් වර්ෂ 1 ½ ත් අතර කාල ප්‍රමාදයකින් ගාස්තු ගෙවීම නිසා දැන්වීම් පුවරු 29 කින් රු.848,965 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | ක්ෂේත්‍රයේ පවතින දැන්වීම් හඳුනාගෙන අදාළ ආයතන දැනුවත් කර ඇති බව. | දැන්වීම් පුවරු ගාස්තු කාලීනව අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ප්‍රසම්පාදන සැලැස්ම** | | |
| | ක්‍රියාකාරකම් 36 කින් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මද තිරසාර සංවර්ධන මහපෙන්වීම්වලින් බැහැරව සකස් කර තිබුණි. | 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තිරසාර සංවර්ධන මහපෙන්වීම් අනුව සකස් කර ඇති බව. | ප්‍රසම්පාදන සැලැස්ම තිරසාර සංවර්ධන මහපෙන්වීම් අනුව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| | i. 1987 අංක 18 දරන නගර සභා ආඥා පනතේ VI වන කොටසේ විධිවිධාන පරිදි කසල කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස්කර නොතිබුණි. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථාවක් පනවාගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථාවක් පනවා කසල කළමනාකරණය විධිමත් කළ යුතුය. |
| | ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අම්බලම්මුල්ල අක්කර 10 ක පමණ වූ වගුරු ඉඩමකට සභා බල ප්‍රදේශයේ සියයට 75 කින් දෛනිකව එකතු කරනු ලබන දිරන කසල ට්‍රැක්ටර් ලෝඩ් 25ක් සහ නොදිරන කසල වර්ෂ ගණනාවක සිට බැහැරකර තිබුණු අතර, වාර්ෂිකව එකතු වන යකඩ කිලෝ ග්‍රෑම් 12000 ක්, ප්ලාස්ටික් කිලෝ ග්‍රෑම් 18000 ක්, වීදුරු කිලෝ ග්‍රෑම් 6000 ක් සභාව විසින් බාහිර පාර්ශවවලට වෙන්කර අලෙවි කර ගැනීමට අවස්ථාව සලසා තිබුණි. | ඉදිරියේදී විශේෂ අවධානය යොමුකර කටයුතු කරන බව. | කසළ නිසි පරිදි බැහැර කිරීමට සහ එමගින් ලබාගත හැකි ආදායම් සහා අරමුදලට ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| | iii. සභා බල ප්‍රදේශයේ කර්මාන්ත ශාලා 25 ක් පැවතියද ඉන් කර්මාන්ත ශාලා 06 ක පමණක් අපද්‍රව්‍ය රැස්කරන අතර, අනෙකුත් කර්මාන්ත ශාලාවලින් ජනනය වන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරියේදී විශේෂ අවධානය යොමුකර කටයුතු කරන බව. | කසළ නිසි පරිදි බැහැර කර ජනතාවට සුවදායී පරිසරයක් නිර්මාණය කළ යුතුය. |
| (ඇ) | **මහජන පැමිණිලි** | | |
| | 2023 වර්ෂයේ ලැබී තිබුණු මහජන පැමිණිලි 02 ක් සහ 2024 වර්ෂයේ ලැබී තිබුණු මහජන පැමිණිලි 03 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විසඳා නොතිබුණි. මෙම පැමිණිලි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතු ස්වභාවයේ පැමිණිලි වී තිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස් උපදෙස් ප්‍රකාරව කටයුතු කරන බව. | මහජන පැමිණිලි හැකි ඉක්මනින් විසඳීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව බල ප්‍රදේශයේ වෙළඳ පුවරු සමීක්ෂණය කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ ස්ථානවල වෙළඳාම සම්බන්ධ දැන්වීම්වලින් අය කර ගැනීම සඳහා සමීක්ෂණය කරමින් පවතින බව. | තම බල ප්‍රදේශයේ වෙළඳ පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ගාස්තු අයකිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | නගර සභා බල ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.22,444,000 ක මුදලක් කටාන ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබියදී, වර්ෂ 01 ත් වර්ෂ 07 ත් අතර කාලපරාසයකට අදාළ වන රු.10,244,000 ක වටිනාකමක් සහිත ඉඩම්වල අයිතිය 2024 දෙසැම්බර් 31 දක්වාම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූලික පියවර සභාව විසින් සිදුකර ඇති අතර ඉදිරියේදී අනෙකුත් කටයුතු සිදුකර ගැනීමට කටයුතු කරන බව. | ඉඩම්වල අයිතිය නිරවුල් කරගෙන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පරිගණක මෘදුකාංග පද්ධතියක් මගින් මිශ්‍ර ආදායම්, ජල බිල්පත්, තොග හා ගබඩා කළමනාකරණය, ජාලගත කිරීමේ පද්ධතිය මිලදී ගැනීමට සහ සේවා ගාස්තු ලෙස රු.1,657,692 ක් වැයකර තිබුණද, මෘදුකාංග මගින් කාර්යයන් ඉටුකර ගැනීමේ ඉලක්කය සපුරාගෙන නොතිබුණි. | සියළු ලැබීම්, ගෙවීම් මෘදුකාංගයට ඇතුලත් කර මාසිකව සැසඳුම් ප්‍රකාශ සැසඳීම ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂිත බව. | මෘදුකාංග පද්ධතියක් මගින් අපේක්ෂිත ඉලක්කය සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නගර සභා සීමාව තුල පිහිටි වීථි පහන් සමග මාර්ග පද්ධතිය සිතියම්ගත කිරීම සම්බන්ධ ප්‍රසම්පාදනයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණු අතර, 2.11.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ රැස්වීම්වල දින සහ වේලාවන් නියම කිරීම කර නොතිබුණි. එලෙසම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.8 ,4.3.1 (අ), 2.8, 2.11.1 (අ) , 2.11.2, 2.11.3 (අ), 2.12 (අ) , 5.1.1 (අ)(ආ), 5.2.1 (අ) (ආ), 5.6.1(අ), 6,3,3 (අ), 6.3.6, 7.9 සහ 9.7.2 යන මාර්ගෝපදේශ අනුවද කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ රු.11,665,080 ක මුළු ණයගැති ශේෂයෙන් වර්ෂ 05 ට වැඩි රු.962,076 පැවතුණි. මෙම මුදල් අයකර ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවදානය යොමුව නොතිබුණි. | 2025 වර්ෂයේ කඩිනමින් නිරවුල් කරන බව. | ණයගැති ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ඊ) | 2024 දෙසැම්බර් 31 දින රු.142,787,792 ක් වූ මුළු ණයහිමි ශේෂයෙන් වර්ෂ 5ට වැඩි රු.2,371,611 ක ශේෂයක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.161,764 ක ශේෂයක් ද, වර්ෂ 1 ත් 2 ත් අතර රු.11,076,462 ක ශේෂයක් ද පැවතුණි. | 2025 වර්ෂයේදී ගෙවීම් කරන බව හෝ ඉවත් කිරීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂවල පැවැත්ම පරික්ෂාකර බලා නිරවුල් කළ යුතුය. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 347 ප්‍රකාරව වාර්ෂික බදු ලබාදුන් දේපල 07 කට අදාල ටෙන්ඩර් ක්‍රියාවලියේදී ටෙන්ඩර් කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර නගර සභා මූල්‍ය රීති 330, 335, 341 සහ 373 අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නගර සභා මූල්‍ය රීති අනුව දේපළ බදු දීමේදී කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනයක් වෙත කුලියට ලබා දී තිබුණු ගොඩනැගිල්ලක් වෙනුවෙන් අයකළ යුතු රු.1,677,409 ක දඩ මුදල 2025 මාර්තු 10 වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නෛතික ක්‍රියාමාර්ග ගන්නා බව. | දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි 23(2) අනුව පර්චස් 88.82 ක් වූ ඉඩමේ අවම වෙන්දේසි ඉඩම් අනු බෙදුම් කර අලෙවියේදී සභාවට පවරා දෙනු ලබන පොදු ඉඩම් කොටස ලියාපදිංචියට අදාල වෙන්දේසිකරු ගෙවිය යුතු මුද්දර බදු වියදම් වටිනාකම රු.111,000,000 ක්ව තිබියදී රු.100,000 ක වටිනාකමකට ලියාපදිංචි කර තිබීම නිසා 2006 අංක 12 දරන මුද්දර බදු පනත (විශේෂ ප්‍රතිපාදන) අනුව සියයට 2 ක අනුපාතිකය මත රු.110,900,000 ක් සඳහා සභා අරමුදලට ලැබිය යුතු වන මුද්දර බදු ආදායම් රු. 2,218,000 ක් අහිමි වී තිබුණි. | 1980 අංක දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ නිසි පරිදි මුදල් ගෙවූ සාධන පත්‍රයක් බවට පත්කිරීමට කටයුතු කරන බව. | මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර සිදුවූ අලාභය අයකර ගත යුතුය. |
| (ඈ) | 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි II වන කොටසේ 23(2) වගන්තිය අනුව වෙන්කරන ලද ඉඩම් කොටස කිසිදු ගාස්තුවලින් තොරව මෙහි 1 වන උපලේඛනයේ "අ" ආකෘතියෙහි vi වන ඇමුණුම පරිදි අදාල අධිකාරිය වෙත පැවරිය යුතු වුවද, වෙන්දේසි ඉඩම් පොදු කොටස් ලබාදීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | I වන උපලේඛනයේ "අ" ආකෘතියෙහි vi වන ඇමුණුම පරිදි කටයුතු කරන බව. | සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම** | | |
| වටිනාකම රු.1,150,000 ක් වූ ටාටා වර්ගයේ ගලි බවුසරය 2023 අගෝස්තු මාසයේ සිට 2024 දෙසැම්බර් | අළුත්වැඩියාවට අවශ්‍ය කොටස් ඉන්දියාවෙන් | අළුත්වැඩියාවන් නිසිලෙස සිදුකර වත්කම් |

| | | |
|---|---|---|
| 31 දින වනවිටත් අළුත්වැඩියාව අවසන් කටයුතු නොකරමින් ගරාජයෙහි පැවතුණි. | කිරීමට ආනයනය කළයුතු වීම ප්‍රමාදයට හේතුව බව. | කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කසගහවත්ත සම්පත් කේන්ද්‍රය වටා ආරක්ෂිත වැට ඉදි කිරීමේ ව්‍යාපෘතිය ව්‍යාපෘති සැලැස්මක් අනුමතකර ගැනීමකින් තොරව රු.4,635,945 කට ඉදිරිපත් වූ එකම ලංසුකරු මගින් ඉටුකර ගෙන තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1(ඇ) සහ 4.2.2 යන මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 වර්ෂයේදී ක්‍රියාත්මක වූ කර්මාන්ත 10 ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කොන්ත්‍රාත් විචලනය සඳහා හේතුව, ඊට වගකිව යුතු පාර්ශවයන් යනාදිය සඳහන් කර විචලන සහතිකයක් නිකුත් කර නොගෙන අමතර වැඩ සඳහා රු.3,717,015 ක් ගෙවීම්කර තිබුණි. | ඉදිරියේදී ගෙවීම් විචලා කමිටුවකට යොමුකරන බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලේකම් තනතුර, තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරක්, කළමනාකරණ සහකාර තනතුරු 02ක්, පෙර පාසැල් ගුරු තනතුරු 02 ක්, රියදුරු තනතුරු 08ක් හා පැස්සුම්කරු තනතුරක් පුරප්පාඩුව පැවති අතර ආදායම් ඉපයීමේ කාර්ය සඳහා ඍජුවම බලපෑම් කරන ආදායම් පරීක්ෂක තනතුරු 3 ක් පිළිවෙලින් 2013 ජනවාරි 02 දින, 2014 මැයි 11 දින හා 2015 ජූලි 20 දින සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සඳහා නිළධාරීන් ඉල්ලුම් කර ඇති බව. | සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට හැකි අයුරින් කාර්යමණ්ඩලය කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රජයේ මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අර්ධ වාර්ෂික සහ වාර්ෂික ප්‍රගති සමාලෝචනයත්, හඳුනාගත් ඉලක්ක ළගා කර ගැනීමත් දැක්වෙන ප්‍රගති වාර්තා සකස් කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම නැවත පිළියෙල කර ඇති බව. | චක්‍රලේඛයේ උපදෙස් අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සහශ්‍ර සංවර්ධන අරමුණුවලට හා කළමනාකරණ විගණන චක්‍රලේඛවලට අනුව අවදානම් හඳුනාගෙන එම අවදානම්වල ප්‍රමාණාත්මකභාවය පදනම් කර ගනිමින් අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර සණ අපද්‍රව්‍ය කළමනාකරණය, මිලදී ගැනීම්, ගබඩා පරීක්ෂාව, සෞඛ්‍ය හා ප්‍රජා අංශ කාර්යසාධනය සහ වරිපනම් දේපල තාවකාලික තක්සේරු නිවැරදි භාවය පරීක්ෂා කිරීම යනාදිය සිදු කර නොතිබුණි. | නිවැරදිතාවය පරීක්ෂා කිරීමට කටයුතු කරන බව. | සහශ්‍ර සංවර්ධන අරමුණුවලට හා කළමනාකරණ විගණන චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |